ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.09.17 චක්‍රලේඛ අංක 73 /2026

සියළුම දිසා කොමසාරිස්වරුන් වෙත,

**බාලදක්ෂ විශිෂ්ටතා ඇගයීම් ක්‍රියාන්විතය – 2026**

1. හැඳින්වීම

බාලදක්ෂයන් විසින් ලබාගෙන ඇති දැනුම, ප්‍රායෝගික කුසලතා, විනය, නිර්මාණශීලීත්වය, නායකත්ව හැකියාව සහ කණ්ඩායම් හැඟීම විධිමත්ව ඇගයීමේ අරමුණින් **"බාලදක්ෂ විශිෂ්ටතා ඇගයීම් ක්‍රියාන්විතය – 2026"** ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන කොමසාරිස්තුමාගේ සංකල්පයක් මත ජාතික බාලදක්ෂ මූලස්ථානය විසින් කටයුතු සුදානම් කර ඇත.

මෙම වැඩසටහන තුළින් බාලදක්ෂයන්ට තමන් ලබාගෙන ඇති බාලදක්ෂ ශිල්පීය දැනුම හා ප්‍රායෝගික කුසලතා අභියෝගාත්මක පරිසරයක් තුළ ප්‍රායෝගිකව භාවිතා කිරීම සඳහා අවස්ථාව සලසා දීමට අපේක්ෂා කෙරේ.

2. අරමුණු

මෙම වැඩසටහන අරමුණු කිහිපයක් පෙරදැරි කරගෙන ක්‍රියාත්මක කෙරේ, එනම්,

- නායකත්වය, වගකීම දැරීම, ස්වාධීන තීරණ ගැනීම සහ ගැටලු විසඳීමේ හැකියාවන් වර්ධනය කිරීම.
- බාලදක්ෂයන් විසින් ලබාගෙන ඇති බාලදක්ෂ දැනුම හා ප්‍රායෝගික කුසලතා අභියෝගාත්මක පරිසරයක් තුළ භාවිත කිරීමට අවස්ථාව ලබා දීම.
- අභියෝග ජයගැනීමේ ආකල්ප වර්ධනය කිරීම.
- ප්‍රථමාධාර, ගැට හා බැඳුම්, කඳවුරු කුසලතා, ගවේෂණය සහ හදිසි අවස්ථා කළමනාකරණය වැනි ප්‍රායෝගික ජීවන කුසලතා වැඩිදියුණු කිරීම.
- බාලදක්ෂ ව්‍යාපාරයේ මූලික වටිනාකම් හා පරමාදර්ශ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් තහවුරු කිරීම.
- බාලදක්ෂයන් තුළ ස්වයං විශ්වාසය, ධෛර්යය, ඉවසීම, කැපවීම, සහයෝගීතාව, කණ්ඩායම් හැඟීම, විනය හා වගකීම වර්ධනය කිරීම.
- තමන්ගේ නිර්මාණශීලී හැකියාවන් හා දක්ෂතාවයන් ඉදිරිපත් කිරීමට බාලදක්ෂයන්ට අවස්ථාව ලබා දීම. .



65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.
Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

3. යෝජිත ක්‍රියාත්මක අංශ

මෙම විශිෂ්ටතා ඇගයීම් ක්‍රියාත්මකය තුළ පහත ක්‍රියාත්මකයන් පැවැත්වීමට යෝජිතය.

| | |
|---|---|
| 1. ආහාර පිසීම | - 3 දෙනෙකු ගෙන් සමන්විත කාණ්ඩයක් |
| 2. වනවාසියාගේ ආහාර පිසීම | - 4 දෙනෙකු ගෙන් සමන්විත කාණ්ඩයක් |
| 3. ගැට සහ බැමි | - තනි |
| 4. සිතියම් | - තනි |
| 5. ප්‍රථමාධාර | - දෙදෙනෙකු |
| 6. පුරෝගාමී වැඩ | - 4 දෙනෙකු ගෙන් සමන්විත කාණ්ඩයක් |
| 7. කාලීන උපකරණ | - 4 දෙනෙකු ගෙන් සමන්විත කාණ්ඩයක් |
| 8. නිරීක්ෂණය | - තනි |
| 9. විස්මිත විස්කම් | - තනි (අත්වැඩ) |
| 10. හුරුබුහුටිකම | - 19 දෙනෙකු ගෙන් සමන්විත කණ්ඩායමක් |

❖ අංක 1 සිට 10 දක්වා අංශ වෙනුවෙන් ජයග්‍රාහකයින් වෙත අභියෝගතා ධජ ප්‍රදානය කිරීමට කටයුතු කරන අතර ජයග්‍රාහකයන් වෙත ජාතික මට්ටමින් සහතික පත් පිරිනැමීමට තීරණය කර ඇත.

4. ඇගයීමේ ප්‍රධාන අංශ

මෙම විශිෂ්ටතා ඇගයීම් ක්‍රියාත්මකයේ දක්ෂතා

- බාලදක්ෂ දැනුම හා කුසලතා
- කාර්යයේ නිවැරදිභාවය හා ප්‍රායෝගික භාවිතය
- කාල කළමනාකරණය
- විනය හා ආරක්ෂක ක්‍රමවේද පිළිපැදීම
- නිර්මාණශීලීත්වය හා නවෝත්පාදන හැකියාව
- කණ්ඩායම් හැඟීම හා සහයෝගීතාව
- නායකත්වය හා වගකීම
- ගැටලු විසඳීම හා ස්වාධීන තීරණ ගැනීම
- පිරිසිදුකම, පිළිවෙළ හා උපකරණ නිසි ලෙස භාවිත කිරීම
- බාලදක්ෂ ආචාරධර්ම හා වටිනාකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම

වැනි නිර්ණායක පදනම් කර ගනිමින් ඇගයීමට ලක්කිරීම සිදු කරන අතර එක් එක් අංශ සඳහා ලකුණු ලබාදීමේ දී පදනම් කර ගනු ලබන නිර්ණායක හා ලබාදීමට අපේක්ෂා කරන ලකුණු ප්‍රමාණය සම්බන්ධයෙන් පූර්ව දැනුම්වත් කිරීමක් කරනු ලබයි.

5. සහභාගීත්වය

සෑම බාලදක්ෂ දිසාවකට ම අයත් සියලු ම බාලදක්ෂ කණ්ඩායම් මෙම ක්‍රියාත්මකය සඳහා සහභාගී කරවීමට කණ්ඩායම් භාර නායකවරුන්/නායිකාවන් කටයුතු කළ යුතු ය.

සෑම අංශයක් ම කණ්ඩායම් මට්ටමින් පවත්වා එහි ජයග්‍රාහකයන් දිසා මට්ටමේ ක්‍රියාත්මකය සඳහා සහභාගී කරගත යුතු වේ. දිසාවෙන් තෝරා ගන්නා ජයග්‍රාහකයා හෝ කණ්ඩායම ජාතික මට්ටමේ

ක්‍රියාත්මකය සඳහා ඉදිරිපත් කළ යුතු වේ. බාලදක්ෂයන්ගේ නම්, අවශ්‍ය උපකරණ සහ අනෙකුත් තොරතුරු නියමිත කාලසීමාව තුළ සංවිධායක මණ්ඩලය වෙත ලබා දිය යුතු ය.

6. **මෙම විශිෂ්ටතා ඇගයීම් ක්‍රියාත්මකයේ ක්‍රමවේදය හා කාලසටහන**

ක්‍රියාත්මකය අදියර තුනකින් සංවිධානය කෙරේ.

- පළමු අදියර - කණ්ඩායම් මට්ටමින් තෝරා ගැනීම - ඔක්තෝබර් 10 වන විට,
- දෙවන අදියර - දිසා මට්ටමින් තරගය - ඔක්තෝම්බර් 30 වන විට,
- ජාතික මට්ටමේ අවසන් ක්‍රියාත්මකය - ජාතික මට්ටමේ අවසන් ක්‍රියාත්මක වටය **නොවැම්බර් මස අවසන් කිරීමට නියමිතයි.**

7. **විනිශ්චය**

- එක් එක් ක්‍රියාත්මක අංශයක් (ඉසව්ව) සඳහා අදාළ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා පළපුරුද්ද ඇති සුදුසුකම්ලත් ස්වාධීන විනිශ්චයකරුවන් පාසල් හා දිසා මට්ටමින් පත් කළ යුතු ය.
- විනිශ්චය කිරීම සඳහා අදාළ විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා අවබෝධයක් ඇති පුද්ගලයන් විනිශ්චයකරුවන් ලෙස පත් කළ යුතු ය.
- සියලු ම සහභාගීවන්නන් සඳහා එකම නිරීක්ෂණ කොන්දේසි සහ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුගමනය කළ යුතු ය.
- එක් එක් බාලදක්ෂයා ලබාගත් ලකුණු නිවැරදිව සටහන් කර තබාගත යුතු ය.

අ. ප්‍රථමාධාර අංශයේ ක්‍රියාත්මකය ඇගයීම් සිදු කිරීම

පාසල් මට්ටමින් ඇගයීම - දිසා සංගමයේ අධීක්ෂණය හා උපදෙස් යටතේ බාලදක්ෂ කණ්ඩායම විසින් පත්කරන පරීක්ෂකවරයෙකු / පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ඇගයීම.

(පරීක්ෂණ මණ්ඩලය - හෙද නිලධාරියෙකු/ප්‍රථමාධාර පුහුණු කරුවෙකු හෝ ප්‍රථමාධාර පුහුණුව ලත් අයෙකු ගෙන් සමන්විත විය යුතු ය.)

දිසා මට්ටම ඇගයීම - දිසා සංගමය විසින් පත්කරන ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ඇගයීම.

(පරීක්ෂණ මණ්ඩලය - හදිසි වෛද්‍ය තාක්ෂණ නිලධාරියෙකු (EMT) / හෙද නිලධාරියෙකු/ප්‍රථමාධාර පුහුණු කරුවෙකු හෝ ප්‍රථමාධාර පුහුණුව ලත් අයෙකුගෙන් සමන්විත විය යුතු ය.)

ආ. ක්‍රියාවින්ත අංශ සඳහා අදාළ විශේෂ නිර්ණායක, ලකුණු ලබාදීමේ ක්‍රමවේදය, සහභාගී විය හැකි බාලදක්ෂ සංඛ්‍යාව සහ අවශ්‍ය උපකරණ පිළිබඳ වැඩිදුර තොරතුරු අතිරේක උපදෙස් පත්‍රිකාවේ ඇතුලත් වේ. (මේ සමඟ අමුණා ඇත.)

8. ආරක්ෂාව හා විනය

සියළු ක්‍රියාන්විතයන් වලදී බාලදක්ෂ ආචාරධර්ම, විනය සහ ආරක්ෂක ක්‍රමවේද දැඩිව පිළිපැදිය යුතුය. විශේෂයෙන් ආහාර පිසීම, වනවාසි ආහාර පිසීම, පුරෝගාමී වැඩ සහ ප්‍රථමාධාර වැනි ඉසව්වලදී ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

බාලදක්ෂයන්ගේ වයස් මට්ටම හා හැකියාවන්ට ගැළපෙන ආකාරයෙන් සියලු ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට කටයුතු කළ යුතුය.

9. පොදු උපදෙස්

(අ) කණ්ඩායම් මට්ටමෙන් හා දිසා මට්ටමෙන් බාලදක්ෂ විශිෂ්ටතා ඇගයීම් ක්‍රියාන්විතය පැවැත්වීමේ වගකීම දිසා කොමසාරිස් වරයා සතු වේ.

(ආ) මෙම ක්‍රියාන්විතයේ දිසා සංවිධායක ලෙස සහය දිසා කොමසාරිස් වැඩසටහන් පත්කළ හැකි ය.

**(ඇ) අවස්ථානු රූපීව හා කාලානුරූපීව ජාතික බාලදක්ෂ මූලස්ථානය මගින් නිකුත් කරනු ලබන උපදෙස් හා මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කල යුතු ය.**

(ඈ) මෙම බාලදක්ෂ විශිෂ්ටතා ඇගයීම් ක්‍රියාන්විතය සඳහා සහභාගී නොවන හෝ සක්‍රීයව දායකත්වය නොදෙන කිසිදු බාලදක්ෂ දිසාවක් 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය සඳහා සම්බන්ධ කර නොගැනීමට ජාතික බාලදක්ෂ මූලස්ථානය තීරණය කර ඇත.

**"දැනුමෙන් සන්නද්ධව, කුසලතාවෙන් සවිමත්ව, අභියෝග ජයගනිමින් විශිෂ්ටත්වය කරා"** යන අරමුණ පෙරදැරි කරගෙන මෙම බාලදක්ෂ විශිෂ්ටතා ඇගයීම් ක්‍රියාන්විතය සාර්ථක කර ගැනීමට සියලු දෙනාගේ උපරිම සහයෝගය ලබා දිය යුතු ය.

10. එක් එක් ක්‍රියාන්විත අංශ ජාතික මට්ටමෙන් සංවිධානය කරනු ලබන කොමසාරිසවරුන්ගේ විස්තර මේ සමග අමුණා ඇති උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති අතර, එක් එක් අංශ පිලිබඳව වැඩිදුර තොරතුරු එම සංවිධායක කොමසාරිස්වරයා අමතා ලබාගත හැකි ය.

ස්තුතියි
මෙයට
බාලදක්ෂ සේවයේ නියුතු

ගත් රමේෂ්
ජාතික වැඩසටහන් කොමසාරිස්

නිතිඥ මනෝජ් නානායක්කාර
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

:

පිටපත - ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
සභාපති/විධායක කමිටු සභාපති/ගරු ලේකම්//ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය